© සියලුම හිමිකම් ඇවිරිණි

අනු අංකයඃ ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය
## අන්තර්මධ්‍ය අදියර
## 2010 මාර්තු විභාගය

විභාග දිනය : 2010 මාර්තු 13 පිටු ගණන : 07

විභාග වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30 ප්‍රශ්න ගණන : 05

අයදුම්කරුවන්ට උපදෙස්ඃ

1. නියමිත කාලය පැය 3 කි.
2. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| **මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය** | **(FAR / 601)** |

---

**ප්‍රශ්න අංක 01** (ලකුණු 18)

සීමිත පොදු සමාගම් වන ඇල්ෆා පී.එල්.සී. හා සීමිත බීටා යන සමාගම්වල 2009.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා සාරාංශගත ආදායම් ප්‍රකාශ පහත දැක්වේ.

| | (රු. '000) ඇල්ෆා සීමිත පොදු සමාගම | සීමිත බීටා සමාගම |
|---|---|---|
| විකුණුම් | 59,000 | 36,000 |
| විකුණුම් පිරිවැය | (31,200) | (12,400) |
| **දළලාභය** | **27,800** | **23,600** |
| වෙනත් ආදායම් | 1,760 | 1,400 |
| බෙදාහැරීමේ වියදම් | (5,450) | (3,330) |
| පරිපාලන වියදම් | (6,030) | (3,100) |
| වෙනත් වියදම් | (950) | (460) |
| මූල්‍ය වියදම් | (1,800) | (1,100) |
| **බදු පෙර ලාභය** | **15,330** | **17,010** |
| බදු | (4,100) | (4,600) |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | **11,230** | **12,410** |

2009.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය පහත උපුටා දක්වා ඇත.

| | (රු. '000) ඇල්ෆා සීමිත පොදු සමාගම | සීමිත බීටා සමාගම |
|---|---|---|
| 2008.04.01 දිනට රඳවාගත් ලාභය | 21,200 | 6,900 |
| වර්ෂය සඳහා ලාභය | 11,230 | 12,410 |
| පොදු සංචිතයට මාරු කළා | (2,100) | (1,600) |
| **අතුරු ලාභාංශ** | | |
| වරණීය | (1,900) | (600) |
| සාමාන්‍ය | (1,000) | (900) |
| **යෝජිත ලාභාංශ** | | |
| වරණීය | | |
| 2009.03.31 දිනට ශේෂය | (1,900) | (600) |
| | 25,530 | 15,610 |

**පහත දැක්වෙන තොරතුරු අදාළ වේ.**

(1) සීමිත බීටා සමාගම, වර්ෂය තුළ දී සීමිත ඇල්ෆා පොදු සමාගමට රු.3,200,000/- ක් වූ විකුණුම් මිලකට භාණ්ඩ විකුණන ලදී. මේ සඳහා සීමාසහිත බීටා සමාගම භාණ්ඩවල පිරිවැයෙන් 20% ක ලාභ ආන්තිකයක් තබා ගන්නා ලදී. සීමිත ඇල්ෆා පොදු සමාගමේ තොගයේ මෙම භාණ්ඩවලින් ඉන්වොයිස් වටිනාකම වූ රු.900,000/- ඇතුළත් වී තිබුණි.

(2) සීමිත ඇල්ෆා පොදු සමාගම 2007.04.01 දින සීමිත බීටා සමාගමේ 80% සාමාන්‍ය කොටස් හා 35% වරණීය කොටස් මිලදී ගන්නා ලදී. එදිනට සීමිත බීටා සමාගමේ ලාභාංශ ශේෂය රු.1,600,000/- ක් විය.

(3) සීමිත බීටා සමාගම, සීමිත ඇල්ෆා පොදු සමාගමට 2008.10.01 දින 18% වාර්ෂික පොලියට රු. 2,000,000/- ක ණය මුදලක් දෙන ලදී. සීමිත බීටා සමාගම, පොලී ආදායම නිසි පරිදි ගිණුම්ගත කර ඇතත්, සීමිත ඇල්ෆා පොදු සමාගම පොලී වියදම ඇල්ෆා සමාගමේ පොත්වල ගිණුම්ගත කර නොතිබුණි.

(4) අදාල වර්ෂය තුළ දී පහත සඳහන් ගනුදෙනු සිදු වී ඇත.

   (i) සීමිත ඇල්ෆා සමාගමෙන් ලබාගත් ගොඩනැගිලි පරිශ්‍රයක් වෙනුවෙන් රු. 30,000/- ක මාසික කුලියක් සීමිත බීටා සමාගම ගෙවා ඇත.

   (ii) සීමිත ඇල්ෆා සමාගම, සීමිත බීටා සමාගමට කාර්තු පදනම යටතේ රු. 60,000/- ක් ගෙවා ඇත.

(5) සීමිත ඇල්ෆා සමාගම ලාභාංශ උපචිත පදනම යටතේ ගිණුම්ගත කර ඇත.

(6) වර්ෂය අවසානයේ දී කීර්තිනාමය පිළිබඳ හානිකරණ අලාභ පරීක්ෂණයේ දී එම කීර්තිනාමය රු. 90,000 කින් අඩු කළ යුතු බව තීරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2009.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය. **(ලකුණු 12)**

(b) 2009.03.31 දිනෙන් වසන් වර්ෂය සඳහා රඳවාගත් ඒකාබද්ධ සංචිතය. **(ලකුණු 06)**

**(මුළු ලකුණු 18)**

**<u>ප්‍රශ්න අංක 02</u>** <u>(ලකුණු 21)</u>

සීමිත කමල් පොදු සමාගමේ මූල්‍ය ගණකාධිකාරී පහත සඳහන් කරුණු 2009.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම වෙනුවෙන් ඔබේ අවධානයට යොමු කර ඇත. පහත දැක්වෙන අයිතමයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතාවයන්ට අනුකූලව සීමිත කමල් පොදු සමාගමේ දැක්විය යුතු ආකාරය අදාළ ගිණුම් ප්‍රමිතිවලට යොමු කරමින් පැහැදිලි කරන්න.

(a) වර්ෂ දෙකක කාලයක් තුළ දී ණයට විකුණුම් ආදායම් ගිණුම්ගත කිරීමේ දී ප්‍රමාණාත්මක වරදක් සිදු වී ඇති බව ප්‍රවර්තන වර්ෂයේ දී හඳුනාගන්නා ලදී. 2007/2008 හා 2008/2009 වර්ෂය සඳහා වැඩිපුර ගිණුම්ගත වී ඇති ආදායම පිළිවෙලින් රු. මිලියන 100 ක් හා රු. මිලියන 150 ක් විය. බදු බලපෑම නොසලකා හැරිය යුතු වේ. **(ලකුණු 05)**

(b) සාමාන්‍ය වෙළඳ කටයුතුවලට අමතරව සමාගම 2008/2009 වර්ෂයේ දී කොන්ත්‍රාත් පදනම යටතේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. 2009.03.31 දිනට සමාගමට ස්ථාවර මිල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් කෙරීගෙන යමින් තිබිණ. වර්ෂය සඳහා දරණ ලද කොන්ත්‍රාත්තු පිරිවැය රු.972,000/- කි. මෙම කොන්ත්‍රාත්තුව නිමකිරීම සඳහා වැය කළ යුතු මුදල රු.368,000/- ක් වේ. කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.3,000,000/- කි. වර්ෂය තුළ දී සමාගමට කොන්ත්‍රාත් මුදලෙන් රු.700,000/- ප්‍රගති ගෙවීම් ලෙස ලැබී තිබුණි. අංක 13 දරණ ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධිත ශ්‍රී ල.ගි.ප්‍ර. පිළිබඳව ගණකාධිකාරීට නිසි අවබෝධයක් නොමැත. **(ලකුණු 05)**

(c) ළමා වෙළඳපොළට ඉදිරිපත් කිරීම සඳහා සමාගම විශේෂිත වර්ගයේ සෙල්ලම් බඩුවක් ද නිෂ්පාදනය කරයි. කම්හලේ මාසික සාමාන්‍ය ධාරිතාව ඒකක 20,000 ක් වේ. 2009 මාර්තු මාසයේ දී කම්හල ඒකක 19,000 නිෂ්පාදනය කලේය. නිෂ්පාදන පිරිවැය විස්තර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ඍජු ද්‍රව්‍ය (ඒකකයකට කිලෝ 5 බැගින්) | රු. 100/- | (කිලෝග්‍රෑමයට) |
| ඍජු ශ්‍රමය (ඒකකයකට පැය 6 බැගින්) | රු. 60/- | (පැයකට) |
| මාසික විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | රු. 400,000/- | |
| මාසික ස්ථාවර පොදුකාර්ය පිරිවැය | රු. 800,000/- | |

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 05 අනුව ඒකකයක පිරිවැය ගණනය කිරීම සඳහා ගණකාධිකාරී ඔබේ සහයෝගය අපේක්ෂා කරයි. **(ලකුණු 06)**

(d) 2006 සැප්තැම්බර් 30 දින සමාගම රු. මිලියන 4 කට යන්ත්‍ර මිල දී ගත්තේ ය. එම අවස්ථාවේ මෙම යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය වර්ෂ 10 ක් බවට ඇස්තමේන්තු කරන ලදී. අවශේෂ අගයක් (සුන්බුන් වටිනාකමක්) නොමැති බවට උපකල්පනය කරමින් සමාගම 2009.04.01 දින මෙම යන්ත්‍රයේ ජීවිත කාලය සමාලෝචනය කොට එහි ඉතිරි ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය වර්ෂ 04 ක් බව ඇස්තමේන්තු කරන ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 ට අනුව සත්‍ය පාවිච්චිය පදනම් කරගෙන සරල මාර්ග ක්‍රමයට සමාගම යන්ත්‍රය ක්ෂය කරයි.

ගිණුම් වර්ෂ 2009/2010 සඳහා මෙම යන්ත්‍රයේ ක්ෂය ප්‍රමාණය කොතෙක් ද? **(ලකුණු 05)**

**(මුළු ලකුණු 21)**

**<u>ප්‍රශ්න අංක 03</u>** <u>(ලකුණු 28)</u>

2009.03.31 දිනට සකුරා සමාගමෙන් උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| ප්‍රකාශ කළ ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 2,000,000) | | 43,200 |
| රඳවාගත් ලාභය (01.04.2008) | | 23,600 |
| ප්‍රකාශකළ ප්‍රාග්ධනය (වරණීය කොටස්) | | 6,000 |
| **<u>දේපළ, පිරියත හා උපකරණ</u>** | | |
| - ඉඩම් හා ගොඩනැගිලි (ඉඩම් රු. 19,200,000/-) | 35,200 | |
| - ලී බඩු හා සවිකිරීම් | 12,800 | |
| - මෝටර් රථවාහන | 22,400 | |
| **<u>ක්ෂය ප්‍රතිපාදනය (01.04.2008)</u>** | | |
| - ගොඩනැගිලි | | 2,560 |
| - ලී බඩු හා සවිකිරීම් | | 4,320 |
| - මෝටර් රථවාහන | | 9,600 |
| විකුණුම් | | 96,000 |
| විකුණුම් පිරිවැය | 76,400 | |
| තොග | 14,160 | |
| ලැබිය යුතු දෑ / ගෙවිය යුතු දෑ | 7,040 | 4,260 |
| 12% පරිවර්තනය කළ හැකි ණයකර | | 6,400 |
| 10% බැංකු ණය | | 8,000 |
| පරිපාලන පිරිවැය | 11,280 | |
| බෙදාහැරීම් පිරිවැය | 6,560 | |
| මූල්‍ය පිරිවැය | 1,048 | |
| ආදායම් බදු | 3,200 | |
| ආදායම් බදු ප්‍රතිපාදනය 2007/ 2008 | | 260 |
| ගෙවූ කල්බදු වාරික (280,000 × 12) | 3,360 | |
| අතුරු ලාභාංශ ගෙවීම් | 2,000 | |
| ආයෝජන (පිරිවැය) | 4,000 | |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 4,752 | |

| | 204,200 | 204,200 |
|---|---|---|

**පහත සඳහන් තොරතුරු සපයා ඇත.**

(1) සමාගම කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථවාහන දෙකක් 2008.04.01 දින අත්පත් කරගෙන ඇත. මෙම වාහන දෙකේ මුළු පිරිවැය රු. 8,400,000/- කි. කල්බදු ගිවිසුම් ප්‍රකාරව රු. 280,000/- බැගින් කල්බදු වාරික 36 ක් ගෙවිය යුතු ය. 2008/2009 කාලය තුළ කල්බදු වාරික ගෙවීම් කල්බදු වාරික ගෙවීම් ගිණුමට හර කර ඇති අතර, එහි රු. 520,000/- ක පොලී මුදලක් ද ඇතුළත් ය.

(2) රු. 1,600,000/- කට මිලදී ගත් උපකරණ 2007/2008 වර්ෂය අවසානයේ දී සම්පූර්ණයෙන් ක්ෂය කොට තිබුණි. 2008.04.01 දින අලුත් උපකරණ රු. 800,000/- කට මිලදී ගෙන ඇත. සමාගම දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් පහත සඳහන් අනුපාතයන් උපයෝගී කරගෙන සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ලී බඩු හා සවිකිරීම් | 10% |
| මෝටර් රථවාහන | 20% |

(3) 2007/2008 වර්ෂයට අදාළ රු. 360,000/- ක මුදල 2008/2009 වර්ෂයේ දී ගෙවන ලදී. 2008/2009 වර්ෂයේ ආදායම් බදු වගකීම රු. 3,640,000/- වේ.

(4) ණයකර පොලී වාර්ෂිකව මාර්තු 31 හා සැප්තැම්බර් 30 ගෙවිය යුතුව ඇත. 2008.09.30 දිනෙන් අවසන් වන මාස 6 සඳහා පොලිය දැනටමත් ගෙවා ඇත. ණයකරවලින් 50% උපචිත පොලිය ද සමඟ කොටසකට රු. 12.50 බැගින් සාමාන්‍ය කොටස්වලට පරිවර්තනය කිරීමට 2009 මාර්තු 31 දින තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් ගැලපුම් සටහන් ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි.

(5) 2008 අප්‍රේල් 01 වන දින 12% පොලියට රු. 8,000,000 ක බැංකු ණයක් ලබාගන්නා ලදී. මේ සම්බන්ධයෙන් පළමුවන වාරිකය 2008.08.31 දින ගෙවිය යුතුව තිබුණි. ඉන්පසුව සමාගම විසින් වාරිකයන් නියමිත පරිදි ගෙවන ලදී. වර්ෂයට අදාළ ණය පොලිය ඉක්මනින් ගෙවා දමා ඇත.

(6) බොල් ණය වශයෙන් රු. 360,000/- ක් කපාහැරිය යුතුය. වර්ෂය අවසානයේ පැවති ශේෂයෙන් අඩමාණ ණය වශයෙන් 10% ක ප්‍රතිපාදනයක් කොට එය ගැලපිය යුතුය.

(7) 2008 ඔක්තෝබර් 01 දින සමාගම කොටසකට රු. 30/- බැගින් කොටස් 200,000 ක වරණීය කොටස් නිකුත් කරන ලදී. වරණීය කොටස්හිමියන්ට වර්ෂයකට, එක කොටසක් සඳහා ලාභාංශ වශයෙන් වර්ෂයකට රු. 1.50 ක් හිමි වේ. ශේෂ පිරික්සුමේ දක්වා ඇති අතුරු ලාභාංශවලින් නියෝජනය වනුයේ සාමාන්‍ය කොටස්හිමියන්ට කොටසකට රු. 0.50 බැගින් ගෙවන ලද ලාභාංශ වේ. අවසාන ලාභාංශය වශයෙන් සාමාන්‍ය කොටස්හිමියන්ට කොටසකට රු. 1/- ක් අධ්‍යක්ෂවරුන් යෝජනා කර ඇත.

(8) සමාගම් ඉදිරි ප්‍රාග්ධන තැනීම් කටයුතු වෙනුවෙන් බාහිර කොන්ත්‍රාත්කරුවකු සමඟ රු. 5,000,000/- ක වටිනාකමක් සඳහා ගිවිසුමකට එළඹී ඇත.

(9) පරිපාලන පිරිවැයෙහි පහත සඳහන් වියදම් ඇතුළත් වේ.

| | |
|---|---|
| විගණන ගාස්තු හා වියදම් | රු. 240,000 |
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය | රු. 300,000 |
| පරිත්‍යාග | රු. 250,000 |

(10) සමාගම් මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේ දී 2007 අංක 07 දරණ නව සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වීම අවශ්‍ය වේ.

**ප්‍රසිද්ධ කිරීම සඳහා ඔබ විසින් පහත සඳහන් දෑ පිළියෙල කරන්න.**

(a) 2009 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය **(ලකුණු 09)**

(b) 2009.03.31 දිනට සමාගමේ ශේෂ පත්‍රය **(ලකුණු 07)**

(c) 2009.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය **(ලකුණු 04)**

(d) දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ප්‍රකාශය **(ලකුණු 05)**

(e) අදාළ සටහන් (ලකුණු 03)

(මුළු ලකුණු 28)

**ප්‍රශ්න අංක 04** (ලකුණු 19)

අශෝක, බණ්ඩාර හා චමිල් පිළිවෙලින් 3:2:1 ලාභාලාභ බෙදීමේ අනුපාතයකට හවුල් ව්‍යාපාරයක යෙදී සිටී. 2008 මාර්තු 31 දින උපුටාගත් ශේෂ පත්‍රය පහත දැක්වේ.

| | | රු. '000 |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| *දේපළ, පිරියත හා උපකරණ* | | |
| - ඉඩම් හා ගොඩනැගිලි | | 2,800 |
| - මෝටර් රථවාහන | | 8,800 |
| - වෙනත් දේපළ, පිරියත හා උපකරණ | | 16,640 |
| | | 28,240 |
| ආයෝජන | | 1,280 |
| කීර්තිනාමය | | 720 |
| | | 30,240 |
| **ජංගම වත්කම්** | | |
| තොග | 8,320 | |
| ලැබිය යුතු දෑ | 7,680 | |
| බැංකු හා මුදල් | 960 | 16,960 |
| **මුළු වත්කම්** | | 47,200 |
| **ස්කන්ධය හා වගකීම්** | | |
| ප්‍රාග්ධන ගිණුම් | | |
| අශෝක | 6,720 | |
| බණ්ඩාර | 4,800 | |
| චමිල් | 3,840 | 15,360 |
| ජංගම ගිණුම් | | |
| අශෝක | 1,440 | |
| බණ්ඩාර | 1,120 | |
| චමිල් | 600 | 3,160 |
| | | 18,520 |
| 2007/2008 ලාභය | | 6,720 |
| | | 25,240 |
| **ජංගම නොවන වගකීම්** | | |
| බැංකුණය | 4,800 | |
| ණය - බණ්ඩාර | 3,200 | 8,000 |
| **ජංගම වගකීම්** | | |
| ගෙවිය යුතු දෑ | 10,560 | |
| උපචිත | 3,400 | 13,960 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | 7,200 |

ව්‍යාපාරය වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම හවුල් ව්‍යාපාරය සීමිත සමාගමක් බවට පරිවර්තනය කිරීමට හවුල්කරුවන් තීරණය කර ඇත. මේ සඳහා ඔවුන් ABC (පෞද්ගලික) සමාගම ලියාපදිංචි කර ඇත. මෙම සමාගම හවුල් ව්‍යාපාරයේ ආයෝජනය හා කීර්තිනාමය හැර අනෙකුත් වත්කම් අත්පත් කරගන්නා ලදී. සමාගම බණ්ඩාරගේ ණය මුදල් ශේෂ හැර අනෙකුත් වගකීම් අත්පත් කරගන්නා ලදී.

**පහත සඳහන් අතිරේක තොරතුරු ඔබට දී ඇත.**

(1) ධාරණ අගය (Carrying Value) රු.1,600,000/- ක් වූ මෝටර් රථවාහනයක් රු.1,800,000/- කට විකුණන ලදී. ආයෝජනය උපලබ්ධි කිරීමෙන් රු. 1,600,000/- ක් ලැබුණි. බණ්ඩාරගේ ණය මුදල සම්පූර්ණයෙන්ම බේරුම් කිරීම සඳහා රු. 2,880,000/- ක් හවුල් ව්‍යාපාරය ගෙවීය. හවුල් ව්‍යාපාරය වසාදැමීම සඳහා දරණ ලද වියදම් රු. 128,000/- කි. සේවකයන්ගේ සේවය නැවැත්වීම සඳහා හවුල් ව්‍යාපාරය විසින් රු. 640,000/- ක වන්දි මුදලක් ඔවුන්ට ගෙවන ලදී.

(2) හවුල්කරුවන්ට ඔවුන්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂයන් සඳහා 5% ක වාර්ෂික පොලියක් හිමි වේ. සියලුම හවුල්කරුවන්ට එක් අයෙකුට මසකට රු. 48,000/- බැගින් වැටුපක් හිමි වේ.

(3) 2008 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය සම්බන්ධයෙන් ආදායම් බදු මුදල රු. 824,000/- ක් වේ. වර්ෂය සඳහා ස්වතක්සේරු ක්‍රමය යටතේ හවුල් ව්‍යාපාරය ගෙවන ලද රු. 320,000/- ක ආදායම් බදු ලැබිය යුතු දැවල ඇතුළත් කර ඇත. හවුල් ව්‍යාපාරය 2008 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවියයුතු ඉතිරි බදු වගකීම ගෙවීමට හවුල්කරු අශෝක එකඟ වී ඇත.

(4) නව සමාගම කොටසක් රු. 22 බැගින් සාමාන්‍ය කොටස් 800,000 ක් හා කොටසක් රු. 18/- බැගින් වරණීය කොටස් 240,000 ක් ගැනුම් ප්‍රතිශ්‍යාව වෙනුවෙන් විභජනය කිරීමට එකඟ විය.

(5) සීමිත ABC සමාගම සංස්ථාපනය කිරීමෙන් පසු හවුල් ව්‍යාපාරයේ වත්කම් පහත සඳහන් අගයන් යටතේ පොත්පත්වල වාර්තා කිරීමට තීරණය විය.

| | (රු. **'000)** |
|---|---:|
| ඉඩම් හා ගොඩනැගිලි | 4,000 |
| වෙනත් මෝටර් රථවාහන | 6,400 |
| අනෙකුත් දේපළ | 17,600 |

අනෙකුත් වත්කම් පොත්පත් අගයට සමාගම භාරගන්නා ලදී. ලැබිය යුතු දෑ වෙනුවෙන් 10% ක අඩමාන ණය ප්‍රතිපාදනයක් වෙන් කිරීමට තීරණය කර ඇත. තවද සමාගමේ පොත්පත්වල විශ්‍රාම පාරිතෝෂික වශයෙන් රු. 1,200,000/- ප්‍රතිපාදනයක් කිරීමට එකඟ වී ඇත.

(6) හවුල්කරුවන්ට විභජනය කර ඇති කොටස්වලට අමතරව සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය වැඩි දියුණු කිරීමට රු. 24/- බැගින් සාමාන්‍ය කොටස් 400,000 ක් හා රු. 20/- බැගින් වරණීය කොටස් 80,000 නිකුත් කරන ලදී. සමාගම ස්ථාපන කටයුතු සඳහා රු. 254,000/- ක පිරිවැයක් දරා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අශෝක, බණ්ඩාර හා චමිල් හවුල් ව්‍යාපාරයේ ලෙජර් ගිණුම් **(ලකුණු 12)**

(b) ABC (පෞද්ගලික) සමාගමේ ආරම්භක ශේෂ පත්‍රය **(ලකුණු 07)**

**(මුළු ලකුණු 19)**

**ප්‍රශ්න අංක 05** (ලකුණු 14)

සීමිත සඳලංකා පොදු සමාගමේ 2009 මාර්ත- 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය හා එදිනට ජංගම වත්කම් හා වගකීම්වල සංසන්දනාත්මක ශේෂයන් සමඟ පහත දැක්වේ.

**2009 මාර්තු 31 න් අවසන් වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | (රු. '000) |
|---|---|
| විකුණුම් | 76,500 |
| විකුණුම් පිරිවැය | (50,400) |
| දළ ලාභය | 26,100 |
| වියදම් | (15,300) |
| බදු පෙර ශුද්ධ ලාභය | 10,800 |
| ආදායම් බදු | (3,600) |
| බදු පසු ශුද්ධ ලාභය | 7,200 |
| යෝජිත ලාභාංශ | (1,500) |
| රඳවාගත් ලාභය | 5,700 |

වියදම්වල රු. 1,680,000/- ක ක්ෂය ඇතුළත් වී තිබිණ.

| | (රු. '000) | |
|---|---|---|
| **කාරක ප්‍රාග්ධනය** | **31/03/2009** | **31/03/2008** |
| තොගය | 3,840 | 3,360 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 2,520 | 2,730 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 2,355 | 1,440 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 1,560 | 1,290 |
| උපචිත වියදම් | 630 | 840 |
| ගෙවිය යුතු බදු | 1,560 | 750 |
| ගෙවිය යුතු ලාභාංශ | 1,500 | - |

**ඔබ විසින්,**

(a) වක්‍ර ක්‍රමය යොදාගෙන 2009.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය ඔබ විසින් ගණනය කරන්න. **(ලකුණු 08)**

(b) 2009 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දැක්වෙන ගිණුම්කරණ අනුපාතයන් ගණනය කරන්න.
   (i) දළ ලාභ අනුපාතය
   (ii) ශුද්ධ ලාභ අනුපාතය
   (iii) තොග පිරිවැටුම් අනුපාතය
   (iv) තොග නේවාසික කාලච්ඡේදය
   (v) ණයගැති පිරිවැටුම් අනුපාතය
   (vi) ණය එකතු කිරීමේ කාලය

**(ලකුණු 06)**
**(මුළු ලකුණු 14)**

ප්‍රශ්න පත්‍රය අවසානයි